**ජාතික ළමා සංවර්ධන අරමුදල - 2015**

---

ජාතික ළමා සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ . තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ළමා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි

මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කර ඇති බව දක්වා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,987,857 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,077,829 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂකව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,065,686 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 4.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ළමා සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ යුද වාතාවරණය හා වෙනත් ස්වභාවික ආපදාවන් නිසා තම දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වූ දරුවන්ට මෙන්ම ආර්ථික දුෂ්කරතා නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට හා සහජ කුසලතා හා වෙනත් දක්ෂතා වර්ධනය කර ගැනීමටද නොහැකි වූ ශ්‍රී ලාංකීක දරුවන්ට මූල්‍යමය ආධාර ලබාදීම වේ. 2014 ජනවාරි 02 දිනැති අංක බීඩී/එන්අයි120/2/07/02-සිඑම් දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශය වූයේ අරමුදල්ද යොදවා යෝජිත වැඩසටහන් වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බවය. ඉකුත් වර්ෂයේදී ළමයින්ට ආධාර ගෙවීම් වශයෙන් රු.1,935,500 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කොඩි අලෙවියෙන් හා ස්ථාවර තැන්පත් ආයෝජන මඟින් ලද ආදායම රු.1,991,001 ක් වුවද ඉන් කිසිදු ළමයෙකුට ආධාර මුදල් ගෙවීමක් සිදුකර නොතිබුණි.

(ආ) ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අරමුදල පාලනය කිරීම, අන්තර් අමාත්‍යාංශ අධීක්ෂණ කමිටුව මගින් සිදුකළ යුතු අතර අවම වශයෙන් මසකට වතාවක් එම කමිටුව රැස්විය යුතු වුවද, 2015 වර්ෂය තුලදී එක් වරක්වත් කමිටුව රැස්වී නොතිබිම හේතුවෙන් අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීමට තීරණ ගෙන නොතිබුණි.

(ඇ) ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ළමා සංවර්ධන අරමුදල ගොඩනැගීම සඳහා අරමුදල් සම්පාදන මාර්ග වශයෙන් පෞද්ගලික අංශයේ ආයතන වලින්, දානපතියන්ගෙන්, රාජ්‍ය බැංකු, ලොතරැයි මණ්ඩල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය යන ආයතන වලින්, මෙරට ලියාපදිංචි රාජ්‍ය නොවන විදේශීය සංවිධාන හා විදේශීය ආයතන හා විදේශීය දානපතියන්ගෙන්, අරමුදල් රැස්කර ගැනීමට හැකියාව තිබුණද ළමා දිනය වෙනුවෙන් නිකුත් කළ කොඩි ආදායම හා ස්ථාවර තැන්පත් පොලි

ආදායම හැර වෙනත් ආදායම් මාර්ගයකින් අරමුදල් රැස්කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ අරමුදල ආයෝජන කටයුතු මෙහෙයවීම හැර සමාලෝචිත වර්ෂයේදී අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යයෙහි යෙදී නොතිබුණි.

(ඈ) අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ළමා දින කොඩි අලෙවි ආදායම වූ අතර සමාලෝචිත වර්ෂයේ ළමා දිනය වෙනුවෙන් මුද්‍රිත කොඩි 400,000 යැවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 342 න් 2015 දෙසැම්බර් 31 වන විට එකතුව රු.635,675 ක මුදල් එවා තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 103 කින් පමණි. 2016 ජුනි 30 වන විටත් කාර්යාල 72 කින් මුදල් එවා නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර අරමුදල් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හා ප්‍රතිලාභී ළමුන් සඳහා නොකඩවා ආධාර මුදල් ලබාදීමේ ක්‍රමවේදයක්ද සකස් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ අභ්‍යන්තර විගණනය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට ඇතුලත්වී තිබුණද එම කාර්යය සැලසුම් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණනය මඟින් ඉදිරිපත් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වරින්වර දැනුම් දෙන ලදී. ලෙජර් ගිණුම් හා ජ'නල් සටහන් මඟින් ගනුදෙනු ගිණුම්ගත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.